# පාරිසරික සංචාරකයාගේ අභිප්‍රේරණ, ආකල්ප හා හැසිරීම් රටා පිළිබඳ අධ්‍යයනයක් ඃ ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නකල්ස් රක්ෂිත ප්‍රදේශය ආශ්‍රයෙනි

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**එස්.පී.එම්. ප්‍රියදර්ශන[1]**
**එස්.පී.දිනේෂා රසාංජලී සේනාරත්න[2]**

**සංක්ෂේපය**

වර්තමානයේ සීඝ්‍රයෙන්සිදුවන සංවර්ධනය හමුවේ විනාශ වෙමින් පවතින ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම සඳහා තිරසර සංවර්ධන සංකල්පයේ අංශයක් ලෙසින් සංචාරක කර්මාන්තයේ ප්‍රභේද අතර ඇති පාරිසරික සංචාරක කර්මාන්තයට ප්‍රධාන තැනක් හිමි වේ. ඒ අනුව පාරිසරික සංචාරකයාගේ අභිප්‍රේණ, ආකල්ප හා හැසිරීම් රටා මනස මූලික කරගෙන පරිසරය කෙරෙහි ක්‍රියාත්මක වේ. මෙම පර්යේෂණයේදී පාරිසරික සංචාරකයාගේ අභිප්‍රේරණයට හේතු වූ සාධක, ආකල්ප හා හැසිරීම් රටා අධ්‍යයනය කිරීම මඟින් තිරසර සංචරණය දියුණු කිරීමට පවතින අවස්ථා ගවේෂණය කිරීම ප්‍රධාන අරමුණ විය.

මෙම පර්යේෂණය සඳහා පාරිසරික සංචාරක ආකර්ෂණයක් ලෙස ප්‍රකට නකල්ස් රක්ෂිතය තෝරාගෙන ඇති අතර එහි ඉළුක්කුඹුර, මහලකොටුව, පිටවල ග්‍රාම නිලධාරි වසම් නියැදි ප්‍රදේශය ලෙස තෝරාගෙන තිබේ. සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ අධ්‍යයන ප්‍රදේශයේ තෙල්ගමු ඔය, රිවර්ස්ටන් කඳු මුදුන හා පිටවල පතන යන ප්‍රධාන ස්ථානවලට සතියකට පැමිණෙන සංචාරකයින්ගෙන් 10% ක් ආවරණය වන පරිදි සංචාරකයින් 40ක නියැඳියකට අනුව දේශීය සංචාරකයින් 30 දෙනෙක් හා විදේශීය සංචාරකයින් 10 දෙනෙක්ද මාර්ගෝපදේශකයින් 10 දෙනෙක්ද වෙතින් ප්‍රශ්නාවලි සමීක්ෂණය මඟින් තොරතුරු රැස්කරන ලදී. තවද ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ මඟින් ප්‍රාථමික දත්ත රැස්කිරීම සිදු කෙරිණි. මෙහිදී ද්විතියික දත්ත විවධ ප්‍රකාශිත මූලාශ්‍ර මගින් ලබා ගන්නා ලදී.

පර්යේෂණයේදී ලබා ගත් ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත, විස්තරාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම හා සරල සංඛ්‍යාන ක්‍රම භාවිතා කර විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව අධ්‍යයන ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින් 90%ක්ම විනෝදය උදෙසා පැමිණෙන අතර ස්වභාව ධර්මයෙන් අනූන පරිසරයේ සුන්දරත්වය හා දේශගුණය සංචාරකයාගේ අභිප්‍රේරණයට හේතු වී ඇත. එමෙන්ම සංචාරකයින්ගෙන් බහුතරයක් දෙනාට පරිසරය පිළිබඳ යහපත් ආකල්පයක් පැවතියද ආරක්ෂාව, යටිතල පහසුකම් හා තොරතුරු සන්නිවේදනයේ දුර්වලතා වැනි ගැටළු පවතින බව අනාවරණය විය. සංචාරකයින්ට මෙම ප්‍රදේශයේ උපරිම නිදහසක් ලැබී තිබුණු අතර අයහපත් හැසිරීම් රටා බහුලව දක්නට ලැබුණි. ඒ අනුව සංචාරකයාගේ මෙන්ම අධ්‍යයන ප්‍රදේශයේ පාරිසරික සංචාරක කර්මාන්තය තුළ සෘණාත්මක සාධක වැඩි වශයෙන් ඇත. මෙම ප්‍රදේශයේ පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීමට ආරක්ෂාව, යටිතල පහසුකම්, තොරතුරුවල සන්නිවේදනය වැඩි කළ යුතු වේ.

**ප්‍රමුඛ පදඃ පාරිසරික සංචාරක කර්මාන්තය, අභිප්‍රේරණ, ආකල්ප**

1. *භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව* malkanthi01@stu.kln.ac.lk
2. *කථිකාචාර්ය, භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව*dinesha@kln.ac.lk